JMC - ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය

JMC- Jayasekera Management Centre (Pvt) Ltd

Advanced Level Seminar Series by JMC

# ගිණුම්කරණය

චමින්ද විදානගේ

*Coordinating Office*

**JMC Jayasekera Management Centre (Pvt) Ltd**

No. 136. Yakkala Road. Gampha.,

Tel : 0332 229 122 | Mob : 0714 114 794| 00 Web : www.jmc.l

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය
Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widan
චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදානගේ ගිණුම්කරණය - චමින්ද විදා
Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accounting - Chaminda Widanage Accountin

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2021
## General Certificate of Education (Adv. Level) Examination 2021

ගිණුම්කරණය I
Accounting I

**33 S I**

පැය දෙකයි
*Two hours*

**උපදෙස්:**

* අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එම අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.
* අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.
* විභාග අංකය, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

විභාග අංකය.............................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

01. ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,
   (1) ආයතනයේ ගනුදෙනු මූලික ලියවිලි මත පදනම්ව මූලික සටහන් පොත් වල වාර්තා කිරීමය
   (2) නෛතික අවශ්‍යතා හා ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමය
   (3) කළමනාකරණ අවශ්‍යතාවට අනුකූලව තීරණ ගැනීමට තොරතුරු ඉදිරිපත් කිරීමය
   (4) ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ආයතනයක තොරතුරු සන්නිවේදනය කිරීමය
   (5) වාර්තාකරණ කාලපරිච්ඡේදයක මූල්‍ය කාර්‍ය සාධනය නිරූපණය කරමින් ආදායම් ප්‍රකාශන පිළියෙල කිරීමය
   (.............)

02. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක නිරූපණය කෙරෙන වගකීම් පිළිබඳව ඉදිරිපත් වන පහත ප්‍රකාශනයන්ගෙන් සත්‍ය වන්නේ,
   A. අතීත සිදුවීමක ප්‍රතිඵලයකි
   B. වාර්තා කරන දිනට බැඳීමකි
   C. බැඳීම නිරාකරණයේදී ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් ආයතනයෙන් පිටතට ගලායයි

   (1) A හා C (2) B හා C (3) A හා B
   (4) B පමණි (5) A, B හා C (.............)

* **අංක 03 සිට 06 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

අමල් 2021.04.01 දින රු. 100 000 ක් ප්‍රාග්ධනය ලෙස යොදා මෝටර් රථ අමතර කොටස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරයි.
අප්‍රේල් මාසයේ ගැනුම් විකුණුම් තොරතුරු,

| ගනුදෙනු අංකය | ගනුදෙනුව | සැපයුම්කරු / ගැනුම්කරු | 8% VAT පෙර වටිනාකම රු.'000 |
|---|---|---|---|
| 1. | භාණ්ඩ ගැනීම | අමර | 100 |
| 2. | භාණ්ඩ විකිණීම | චරිත් | 150 |
| 3. | හැර වූ විකුණුම් | චරිත් | 20 |

*අනෙකුත් ගනුදෙනු,*

4. 10% ක වට්ටමක් යටතේ අමරට ගෙවූ ශුද්ධ මුදල රු. 45 000 කි.
5. චරිත පියවූ මුදල රු. 120 000 කි. දුන් වට්ටම රු. 2 000 කි.
6. මාසයට අදාල මෙහෙයුම් වියදම රු. 100 000 ක් වන අතර මින් ගෙවා ඇත්තේ රු. 80 000 ක් පමණි. ව්‍යාපාරයේ දළ ලාභ අනුපාතය විකුණුම් මිළ මත 40% කි.



මෙහෙයවීම JMC Jayasekera Management Centre (Pvt) Ltd, No. 136. Yakkala Road. Gampha. 0332229122, 0714114794

03. ණයගැතියන් ආශ්‍රිතව සිදු වී ඇති ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛණ අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ඉන්වොයිසිය, ජ'නල් වවුචරය, ලදුපත (2) ඉන්වොයිසිය, හරපත, ලදුපත

(3) ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය (4) ඉන්වොයිසිය, බැරපත, ලදුපත

(5) ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය (............)

04. 2021.04.30 දිනට එකතු කළ අගය මත බදු වගකීම සහ මාසය තුළ මුදල් ප්‍රවාහයේ සිදු වූ ශුද්ධ වෙනස වන්නේ,

| | 2021.04.30 දිනට ගෙවිය යුතු VAT රු. | ශුද්ධ මුදල් ප්‍රවාහය රු. |
|---|---|---|
| (1) | 12 000 | 93 000 ක ගලායෑමකි |
| (2) | 2 400 | 93 000 ක ගලාඒමකි |
| (3) | 2 400 | 27 000 ක ගලායෑමකි |
| (4) | 4 000 | 77 500 ක ගලායෑමකි |
| (5) | 4 000 | 77 500 ක ගලාඒමකි |

(............)

05. 2021 අප්‍රේල් මාසයට අදාල මුළු ආදායම හා මුළු වියදම් වන්නේ,

| | *මුළු ආදායම (රු.'000)* | *මුළු වියදම (රු.'000)* |
|---|---|---|
| (1) | 135 | 180 |
| (2) | 155 | 180 |
| (3) | 135 | 192 |
| (4) | 155 | 160 |
| (5) | 155 | 192 |

(............)

06. ඉහත අංක 02 ගනුදෙනුව ගිණුම් තැබීමේදී එකතු කළ අගය මත බදු (VAT) ඇතුළත් මුළු අගයම ණයගැති පාලන ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර තිබේ. මෙමගින්,

| | හිමිකමට සිදුවන බලපෑම (රු.) | ණයගැති පාලන ගිනුමේ ශේෂය සිදුවන බලපෑම (රු.) |
|---|---|---|
| (1) | 162 000 කින් වැඩිවීම | 12 000 කින් වැඩිවීම |
| (2) | 150 000 කින් වැඩිවීම | බලපෑමක් නැත |
| (3) | 12 000 කින් වැඩිවීම | බලපෑමක් නැත |
| (4) | 162 000 කින් අඩුවීම | 12 000 කින් අඩුවීම |
| (5) | 12 000 කින් අඩුවීම | 12 000 කින් වැඩිවීම |

(............)

07. අමන්දාගේ ව්‍යාපාරයේ 2021.04.02 දින පහත ගනුදෙනු සිදු වී තිබේ.

(i) ණයට භාණ්ඩ විකුණුම් රු. 540 000 කි.
මෙම අගය තුළ 8% ක එකතු කළ අගය මත බදු VAT ඇතුළත්වන අතර ව්‍යාපාරයේ ලාභාන්තිකය පිරිවැය මත 25% කි.

(ii) රු. 20 000 ක පොලී ඇතුලත් රු. 100 000 ක ණය වාරිකය මුදලින් ගෙවීම.

ඉහත ගනුදෙනු මඟින් ගිණුම්කරණ සමීකරණයට ඇතිවන ශුද්ධ බලපෑම නිරූපණය වන පිළිතුර කුමක්ද?

| | *වත්කම් රු.'000* | = | *වගකීම් රු.'000* | + | *හිමිකම් රු.'000* |
|---|---|---|---|---|---|
| (1) | + 40 | = | - 40 | | + 80 |
| (2) | 0 | = | - 80 | | + 80 |
| (3) | + 40 | = | - 80 | | + 120 |
| (4) | + 8 | = | - 80 | | + 88 |
| (5) | + 40 | = | - 60 | | + 100 |

(............)

08. පහත A, B, C, D එකිනෙක අයිතමය නිවැරදිව මූල්‍ය ප්‍රකාශන මූලිකාංගයන්ට වර්ග කළ පිළිතුර වන්නේ,

A. ආපසු එවුම් B. ක්ෂය වෙන් කිරීම C. රඳවාගත් ඉපයුම් D. වගකීම් සහතික වෙන්කිරීම

(1) A - ආදායම්, B - වගකීම්, C - හිමිකම්, D - වගකීම්

(2) A - ආදායම්, B - වත්කම්, C - වියදම්, D - වගකීම්

(3) A - වියදම්, B - වියදම්, C - වගකීම්, D - වගකීම්

(4) A - ආදායම්, B - වත්කම්, C - හිමිකම්, D - වගකීම්

(5) A - වියදම්, B - වත්කම්, C - හිමිකම්, D - වගකීම් (............)



මෙහෙයවීම JMC Jayasekera Management Centre (Pvt) Ltd, No. 136. Yakkala Road. Gampha. 0332229122, 0714114794

Accounting Chaminda Widanage

- **පහත අංක 09 ට හා 10 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

කුරේ ලී බඩු සමාගමේ පහත ගනුදෙනු 2021 ජනවාරි මාසය තුළ සිදු වී තිබේ.

A. නැවත විකිණීමට රු. 500 000 ක ලී බඩු ණයට ගැනීම

B. ව්‍යාපාරයේ පාවිච්චි කිරීමට රු. 150 000 ක කාර්යාල ලී බඩු අත්පිට මුදලට ගැනීම

C. සිංහ සමාගමට ලී බඩු රු. 400 000 කට ණයට විකිණීම

D. රු. 12 000 ක මාසයේ විදුලි බිල ලැබීම

09. ඉහත A, B, C, D ගනුදෙනු වාර්තා කරන මූලික සටහන් පොත් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, පොදු ජ'නලය

(2) ගැනුම් ජ'නලය, ගෙවීම් ජ'නලය, විකුණුම් ජ'නලය, ගෙවීම් ජ'නලය

(3) ගැනුම් ජ'නලය, ගෙවීම් ජ'නලය, විකුණුම් ජ'නලය, පොදු ජ'නලය

(4) ගැනුම් ජ'නලය, පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, ගෙවීම් ජ'නලය

(5) ගැනුම් ජ'නලය, ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය, පොදු ජ'නලය (.............)

10. ඉහත C හා D ගනුදෙනු ගිණුම් තැබීමට අදාළ ගිණුම්කරණ සංකල්පයක් නිවැරදිව දැක්වෙන්නේ,

| | C | D |
|---|---|---|
| (1) | උපචිත | ගිනුම් ඒකක |
| (2) | ගිණුම් ඒකක | උපචිත |
| (3) | උපලබ්ධි | උපචිත |
| (4) | උපලබ්ධි | ආරක්ෂණ |
| (5) | ඓතිහාසික පිරිවැය | ආරක්ෂණ |

(.............)

11. ව්‍යාපාර ආයතනයකට 2021 මාර්තු මාසය වෙනුවෙන් බැංකුවෙන් ලද ප්‍රකාශනයෙහි සාරාංශය පහත පරිදි වේ.

| | හර | බැර | රු.'000 ශේෂය |
|---|---|---|---|
| 2021.03.01 ශේෂය | - | - | 200 |
| මුළු තැන්පතු (රු. 200 000 ක මුදල් තැන්පතු ඇතුළුව) | - | 300 | 500 |
| චෙක් ගෙවීම් | 150 | - | 350 |
| ණය වාරික | 50 | - | 300 |
| සෘජු ප්‍රේෂණ (ආයෝජන ආදායම්) | - | 30 | 330 |

මුළු තැන්පතු කළ පෙබරවාරි මාසයේ රු. 50 000 ක චෙක් තැන්පතු අඩංගු වන අතර මාර්තු මාසයේ මුළු චෙක් තැන්පතු රු. 250 000 කි.
2021 මාර්තු 01 දිනට රු. 40 000 ක ඉදිරිපත් නොකළ චෙක්පත් මාර්තු 31 වන තුරුත් ඉදිරිපත් කර නොමැති අතර මාර්තු මාසයේ නිකුත් කළ චෙක්පත් වලින් රු. 260 000 ක චෙක්පත් මාසය තුළ ඉදිරිපත් කර නැත.

මාර්තු 01 දිනට මුදල් ගිණුමේ ශේෂය සහ මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතු මුදල් ශේෂය.

| | මාර්තු 01 දිනට මුදල් ගිණුමේ ශේෂය *රු.'000* | මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිරූපණය කළ යුතු ශේෂය *රු.'000* |
|---|---|---|
| (1) | 190 | 330 |
| (2) | 190 | 30 |
| (3) | 210 | 230 |
| (4) | 210 | 30 |
| (5) | 200 | 230 |

(.............)

- **අංක 12 ට හා 13 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

ව්‍යාපාර ආයතනයක 2021.03.31 න් අවසන් වසරට පහත තොරතුරරු අදාළ වේ.

| | *රු.'000* |
|---|---|
| කාලපරිච්ඡේදයේ ලාභය | 800 |
| ණයගැතිපාලන ගිණුමේ ශේෂය | 350 |
| ණයහිමි ශේෂ ලැයිස්තු එකතුව | 200 |



මෙහෙයවීම
JMC Jayasekera Management Centre (Pvt) Ltd, No. 136. Yakkala Road. Gampha. 0332229122, 0714114794

පසුව කරන ලද පරීක්ෂාවකදී පහත වැරදි අනාවරණය විය.

- රු. 850 000 ක මාසයක විකුණුම් ජ'නලයේ එකතුව පොදු ලෙජරයේ ණයගැති පාලන ගිණුමට පිටපත් කර ඇත්තේ රු. 580 000 ක් ලෙසය. අනෙකුත් සියළු සටහන් නිවැරදි වේ.
- රු. 25 000 ක බොල්ණය කපා හැරීම අන්තර් ලෙජර මාරු කිරීමක් ලෙස හඳුනාගනිමින් ගිණුම් තැබීම හැර වෙනත් සටහනක් තබා නැත.
- රු. 30 000 ක හැර වූ විකුණුම් නිවැරදිව පොදු ලෙජරයට පිටපත් කර ණයගැති ලෙජරය වෙනුවට ණයහිමි ලෙජරයේ පුද්ගලික ගිණුමකට බැර කර තිබේ.
- මුදල් ගිණුමේ නිවැරදි සටහන් කළ රු. 50 000 ක කොමිස් ආදායමක් කොමිස් වියදම් ගිණුමට හර කර තිබේ.

12. 2021.03.31 අවිනිශ්චිත ගිණුමේ පැවති ශේෂය සහ වර්ෂය සඳහා නිවැරදි ලාභය

| | **අවිනිශ්චිත ගිණුමේ පැවති ශේෂය *රු.'000*** | **සංශෝධිත ලාභය *රු.'000*** | |
|---|---|---|---|
| (1) | හර 170 | 875 | |
| (2) | හර 170 | 825 | |
| (3) | බැර 220 | 825 | |
| (4) | හර 220 | 845 | |
| (5) | හර 220 | 875 | (.............) |

13. 2021.03.31 දිනට ණයගැති පාලන ගිණුමේ සංශෝධිත ශේෂය සහ ණයහිමි ශේෂ ලැයිස්තුවේ නිවැරදි එකතුව,

| | **ණයගැති පාලන ගිණුමේ නිවැරදි ශේෂය *රු.'000*** | **ණයහිමි ශේෂය ලැයිස්තුවේ නිවැරදි එකතුව *රු.'000*** | |
|---|---|---|---|
| (1) | 595 | 205 | |
| (2) | 595 | 205 | |
| (3) | 620 | 205 | |
| (4) | 620 | 195 | |
| (5) | 565 | 195 | (.............) |

14. ලී බඩු වෙළඳ ආයතනයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන පිළිවෙත් පිළිබඳව පහත ප්‍රකාශන ඉදිරිපත් කර තිබේ.

A. නැවත විකිණීමට පවතින ලී බඩු තොග ජංගම වත්කම් ලෙස ද භාවිතා කරන කාර්යාල ලී බඩු ජංගම නොවන වත්කම් ලෙසත් හඳුනාගැනේ.

B. ලී බඩු තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගයෙන් වඩා අඩු අගය මත මනිනු ලැබේ.

C. ණයට විකුණු ලී බඩු මුදල් ලැබී නොමැති බැවින් විකුණුම් ආදායම් ලෙස හඳුනා නොගැනේ.

ඉහත ප්‍රකාශන සත්‍ය ද, අසත්‍ය ද යන්න සහ පිළිතුරට පදනම් වන සංකල්පය නිවැරදිව ඉදිරිපත් වන පිළිතුර වන්නේ,

| | | | | |
|---|---|---|---|---|
| (1) | A - සත්‍ය, ආරක්ෂණ | B - සත්‍ය, ආරක්ෂණ | C - සත්‍ය, උපචිත | |
| (2) | A - සත්‍ය, උපලබ්ධි | B - සත්‍ය, උපචිත | C - සත්‍ය, උපලබ්ධි | |
| (3) | A - අසත්‍ය, ආරක්ෂණ | B - සත්‍ය, ගැලපුම් | C - අසත්‍ය, ගැලපුම් | |
| (4) | A - අසත්‍ය, අඛණ්ඩ පැවැත්ම | B - අසත්‍ය, ගැලපුම් | C - අසත්‍ය, උපලබ්ධි | |
| (5) | A - සත්‍ය, අඛණ්ඩ පැවැත්ම | B - සත්‍ය, ආරක්ෂණ | C - අසත්‍ය, උපලබ්ධි | (.............) |

- **ප්‍රශ්න අංක 15 හා 16 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

අමිත්, දමිත් හා සුමිත් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ 2021.03.31 න් අවසන් වසරේ ලාභාලාභ විසර්ජන ප්‍රකාශනය පහත පරිදි වේ.

| | | *රු.'000* |
|---|---|---|
| කාලපරිච්ඡේදයේ ලාභය | | 300 |
| ප්‍රාග්ධන පොලී | අමිත් | 100 |
| | දමිත් | 150 |
| | සුමිත් | 150 |
| වේතන | අමිත් | 100 |
| | දමිත් | 100 |
| අලාභ කොටස් | අමිත් | (100) |
| | දමිත් | (100) |
| | සුමිත් | (100) |
| | | - |



Accounting Chaminda Widanage

- වසර මුල ප්‍රාග්ධන ශේෂය මත 10% ක පොලියක් විසර්ජනය කළ ද එවැනි වගන්තියක් හවුල් ගිවිසුමේ නැත.
- වාර්ෂික වේතන නිවැරදිව විසර්ජනය ක තිබුණ ද ලාභාලාභ බෙදීමේ අනුපාතය පිළිවෙලින් 3 : 2 : 1 වේ.
- වර්ෂය තුළ සිදු කළ හවුල්කරුවන්ගේ මුදල් ගැනිලි පහත පිරිදි වේ.

  අමිත් රු. 50 000 දමිත් රු. 100 000
- ව්‍යාපාර ගොඩනැගිල්ල වෙනුවෙන් අමිත්ට රු. 100 000 වාර්ෂික කුලි ගෙවිය යුතු වුව ද කිසිදු ගැලපුමක් කර නැත.
- ඉහත ලාභ විසර්ජනය සහ මුදල් ගැනිලි සටහන් කළ පසු ජංගම ගිණුමේ ශේෂ පහත පරිදි වේ.

| | *රු.'000* |
|---|---|
| අමිත් | 200 |
| දමිත් | 150 |
| සුමිත් | 150 |

15. 2020.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම හා 2021.03.31 දිනට අමිත්ගේ ජංගම ගිණුමේ නිවැරදි ශේෂය,

| | **මුළු හිමිකම *රු.'000*** | **අමිත්ගේ ජංගම ගිණුමේ නිවැරදි ශේෂය *රු.'000*** |
|---|---|---|
| (1) | 4 500 | 200 |
| (2) | 4 500 | 300 |
| (3) | 500 | 200 |
| (4) | 4 350 | 200 |
| (5) | 4 350 | 300 |

(.............)

16. 2021.03.31 දින සුමිත් හවුල් ව්‍යාපාරයේ ඉවත් වූ අතර එදින සිට සම සමව ලාභාලාභ බෙදා ගනිමින් අමිත් හා දමිත් හවුල් ව්‍යාපාරය කරගෙන යාමට එකඟ විය. එදිනට සුමිත්ගේ කීර්තිනාම කොටස රු. 200 000 කට එකඟ විය. මුළු කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැලපීමටත් සුමිත්ගේ මුළු හිමිකම ණය ගිණුමකට මාරු කිරීමටත් එකඟ විය. කීර්තිනාම ගැලපීමට පසු අමිත්ගේ ප්‍රාග්ධන ගිණුමේ සහ ඉවත්ව යන හවුල්කරුගේ මුළු හිමිකම වන්නේ,

| | **අමිත්ගේ ප්‍රාග්ධන ශේෂය *රු.'000*** | **ඉවත්වන දිනට සුමිත්ගේ මුළු හිමිකම *රු.'000*** |
|---|---|---|
| (1) | 400 | 1 700 |
| (2) | 1 600 | 1 700 |
| (3) | 1 600 | 1 800 |
| (4) | 1 000 | 1 700 |
| (5) | 1 000 | 1 800 |

(.............)

17. ලාභ අරමුණු කර නොගත් සංගමයක වාර්ෂික සාමාජික ගාස්තුව රු. 500 ක් වන අතර 2020.01.01 දිනට සිටි සාමාජිකයින් ගණන 200 කි.
- 2020.01.01 දිනට සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සාමාජික මුදල් හිඟව තිබූ අතර කලින් ලද සාමාජික මුදල් නොවිය.
- 2020.12.31 දිනට හිඟ සාමාජික මුදල් නොතිබුන අතර සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සාමාජික මුදල් කල් තියා ලැබී තිබුණි.
- 2020.01.01 දිනට මුදල් හිඟව තිබූ සාමාජිකයින් දෙදෙනෙකුගේ සාමාජිකත්වය අහෝසි කරන ලදී.

වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල් අගය සහ සමුච්චිත අරමුදලට ඉහත තොරතුරු මගින් ඇතිවන බලපෑම වන්නේ,

| | **මුදලින් ලද සාමාජික මුදල** *(රු.'000)* | **සමුච්චිත අරමුදලට බලපෑම වැඩිවීම** *(රු.'000)* |
|---|---|---|
| (1) | 106 | 99 |
| (2) | 106 | 98 |
| (3) | 104 | 99 |
| (4) | 100 | 100 |
| (5) | 99 | 100 |

(.............)

Accounting Chaminda Widanage

18. සීමිත කුසුම් පොදු සමාගම පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පහත තොරතුරු අදාළ වේ.

| | | |
|---|---|---|
| වාර්තා කරන දිනය | - | 2021.03.31 |
| මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත් කළ දිනය | - | 2021.04.20 |
| අධ්‍යක්‍ෂකවරු මූල්‍ය ප්‍රකාශන අනුමත කළ දිනය | - | 2021.05.15 |
| වාර්ෂික මහා සභා රැස්වීමේදී මූල්‍ය ප්‍රකාශන කොටස් හිමියන් අනුමත කළ දිනය | - | 2021.06.05 |

පහත සිදුවීම් ඔබ වෙත ඉදිපත් කර තිබේ.

A. 2021.03.31 දිනට පැවති පිරිවැය රු. 500 000 ක් වූ තොග රු. 450 000 කට 2021.04.20 දින විකිණීම

B. 2021.04.05 දින මිලදී ගත් රු. 600 000 තොගයක් 2021.05.05 දින ගින්නකින් විනාශ වීම.

C. 2021.03.20 දින කරන ලද ඉල්ලීමකට අනුව සාකච්ඡා මට්ටමේ පවතින රු. 800 000 රක්‍ෂණ වන්දි ඉල්ලීමකට 2021.04.30 දින අනුමැතිය ලැබීම.

LKAS 10 (වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු සිද්ධීන්) ප්‍රමිතයට අනුව ගලපන සිදුවීම හා නොගලපන සිදුවීම් ලෙස වර්ග කළ විට පිළිතුර වන්නේ,

| | ගලපන සිදුවීම් | නොගලපන සිදුවීම් |
|---|---|---|
| (1) | A, B, C | - |
| (2) | A, C | B |
| (3) | B, C | A |
| (4) | A | B, C |
| (5) | - | A, B, C |

(.............)

19. සීමිත අමිල සමාගමේ 2020.04.01 දිනට පැවති එදිනට ධාරණ අගය රු. 800 000 ක් වූ යන්ත්‍රය එදිනම රු. 1 150 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2017.04.01 මිලදී ගත් මෙම යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 100 000 ක් බවත් ඵලදායී ජීව කාලය වසර 10 ක් බවත් නිගමනය කර තිබුණි. ප්‍රත්‍යාගණනයෙන් පසු ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය වෙනස් නොවේ. යන්ත්‍රය සරල මාර්ගව ක්ෂය කෙරේ.
2017.4.01 දිනට යන්ත්‍රයේ පිරිවැය සහ 2021.03.31 න් අවසන් වසරේ ක්ෂය වියදම,

| | පිරිවැය *(රු.'000)* | ක්ෂය වියදම *(රු.'000)* |
|---|---|---|
| (1) | 1 000 | 115 |
| (2) | 1 000 | 150 |
| (3) | 1 100 | 150 |
| (4) | 1 100 | 115 |
| (5) | 900 | 100 |

(.............)

- **අංක 20 සහ 21 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

සීමිත චරිත් පොදු සමාගමේ 2021.03.31 න් අවසන් වසරට පහත තොරතුරු අදාළ වේ.

| | *රු.'000* |
|---|---|
| විකුණුම් | 1 800 |
| විකුණුම් පිවැය | 1 000 |
| ඉඩම් විකිණීමේ ලාභ | 200 |
| පොලී ආදායම් | 50 |
| ගෙවූ ලාභාංශ | 100 |
| පරිපාලන වියදම් | 200 |
| ප්‍රත්‍යාගණන ලාභ (අලාභ) | |
| ගොඩනැගිලි | 80 |
| යන්ත්‍ර | (60) |
| ලද වට්ටම් | 50 |
| ලද වෙළඳ වට්ටම් | 100 |

2018.04.01 යන්ත්‍ර ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයේදී ඇති වූ අතිරික්තය රු. 40 000 කි. මෙය නිවැරදිව ගිණුම්ගත කර ඇත.
2021.03.31 දින ගොඩනැගිලි ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කර තිබේ.
සමාගම බදු නිදහස් කාලයක ක්‍රියාත්මක වේ.


මෙහෙයවීම JMC Jayasekera Management Centre (Pvt) Ltd, No. 136. Yakkala Road. Gampha. 0332229122, 0714114794
Accounting Chaminda Widanage

20. 2021.03.31 න් අවසන් වසර සඳහා සමාගමේ මුළු ආදායම හා වෙනත් විස්තීර්ණ ආදායම,

| | මුළු ආදායම *(රු.'000)* | වෙනත් විස්තීර්ණ ආදායම *(රු.'000)* |
|---|---|---|
| (1) | 2 180 | 40 |
| (2) | 2 180 | 80 |
| (3) | 2 100 | 40 |
| (4) | 2 200 | 80 |
| (5) | 2 200 | 80 |

(.............)

21. 2021.03.31 න් අවසන් වසර සඳහා මුළු විස්තීරණ ආදායම සහ එදිනට රඳවාගත් ඉපයුම්,

| | මුළු විස්තීර්ණ ආදායම *(රු.'000)* | රඳවාගත් ඉපයුම් *(රු.'000)* |
|---|---|---|
| (1) | 1 060 | 880 |
| (2) | 1 060 | 780 |
| (3) | 1 060 | 980 |
| (4) | 920 | 880 |
| (5) | 920 | 780 |

(.............)

22. LKAS 37 ප්‍රතිපාදන අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතයට අනුව පහත කවර ප්‍රකාශ නිවැරදිවේද?

A. නෛතික බැඳීම මෙන්ම සම්මුතික බැඳීමද ප්‍රතිපාදනයට අදාළ වර්තමාන බැඳීමක් ඇති කරයි.

B. අගය නිශ්චිත ප්‍රකාශ කළ නොහැකි වුව ද අගය ඇස්තමේන්තු කර මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රතිපාදන හඳුනාගැනේ.

C. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වගකීම් ලෙස හඳුනා නොගැනේ.

(1) A පමණක් (2) A හා B (3) B හා C

(4) C පමණක් (5) A, B හා C (.............)

23. සීමිත දිමුත් සමාගම 2020.04.01 දින ආරම්භ කළ අතර පහත තොරතුරු 2021.03.31 න් අවසන් වසරට අදාළ වේ.

| | 2021.03.31 ට ශේෂ *(රු.'000)* |
|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | 200 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 150 |
| තොග | 250 |
| උපචිත වියදම් | 60 |
| රඳවාගත් ඉපයුම් | 300 |
| දේපළ, පිරියත හා උපකරණ | 900 |

- රු. 100 000 ක් ලාභාංශ වර්ෂය තුළ ගෙවා නියමිත පරිදි ගිණුම්ගත කර තිබේ.
- සමාගම බදු නිදහස් කාලසීමාවක් තුළ ක්‍රියාත්මක වේ.
- 2020.04.01 මිළදී ගත් දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත 10% ක් වාර්ෂික ක්ෂය ප්‍රතිශතයක් මත ක්ෂය කර තිබේ.
- වසරට අදාළ මුලු බැංකු ණය පොලියෙන් 50% ක් ගෙවා නැත. රු. 30 000 ක් වන එම අගය උපචිත වියදම් තුළ ඇතුලත්ය.

2021.03.31 න් අවසන් වසර සඳහා මෙහෙයුම් කටයුතු වලින් ඊහි වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වන්නේ,

*රු.'000*

(1) 100 (2) 200 (3) 300 (4) 260 (5) 230 (.............)

24. සීමිත අරලිය සමාගමේ 2021.03.31 න් අවසන් වසරට පහත තොරතුරු අදාළ වේ.

| | *රු.'000* |
|---|---|
| 20.04.01 ට තොග | 300 |
| 21.03.31 ට තොග | 100 |
| 20.04.01 ට ණයගැතියෝ | 150 |
| 21.03.31 ට ණයගැතියෝ | 100 |

- සමාගමේ තොග පිරිවැටුම් අනුපාතය වාර 10 ක් වන අතර විකුණුම් මත ලාභ අනුපාතය 20% කි.



Accounting Chaminda Widanage

සමාගමේ 2021.03.31 න් අවසන් වසරේ විකුණුම් සහ ණයගැති පිරිවැටුම් අනුපාතය වන්නේ,

| | විකුණුම් *(රු.'000)* | ණයගැති පිරිවැටුම් අනුපාතය *(රු.'000)* | |
|---|---|---|---|
| (1) | 2 500 | 20 | |
| (2) | 2 500 | 25 | |
| (3) | 2 000 | 16 | |
| (4) | 1 600 | 12.8 | |
| (5) | 1 600 | 12.8 | (.............) |

25. සීමිත සමාගමක 2021.03.31 න් අවසන් වසරේ පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු මත පදනම්ව ගණනය කළ ජංගම අනුපාතය 0.8 : 1 වේ. මෙම අනුපාතය වර්ධනය කර ගනිමින් ද්‍රවශීලතාව වැඩි කර ගැනීමට සමාගම අපේක්ෂා කරයි. මේ සඳහා පහත විකල්ප යෝජනා වී තිබේ.

A. කොටසක ප්‍රතිශ්ඨාව රු. 10 ක් වූ සාමාන්‍ය කොටස් මිලියනයක් නිකුත් කිරීම.
B. මිලියන 20 ක තොග වහාම අලෙවි කිරීම.
C. මිලියන 50 ක් වන වෙළඳ ලැබිය යුතු දෑ වලින් හැකි ඉක්මනින් මුදල් ලබා ගැනීම.

මෙම යෝජනාවලින් අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට ඔබ අනුමත කරන්නේ,

(1) A හා B (2) B පමණක් (3) C පමණක්
(4) A පමණක් (5) A, B හා C (.............)

- **අංක 26 සහ 27 ට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

එකලස් නිමැවුම් ලෙස නිෂ්පාදන මධ්‍යස්ථාන දෙකක් හා සේවා මධ්‍යස්ථානයක් සහිත නිෂ්පාදන ආයතනයක රු. 400 000 ක සේවා මධ්‍යස්ථානයේ මුළු පොදුකාර්ය මුළු මනින්ම නොසලකා හැර පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කර තිබේ.
ඒ අනුව රු. 300 ලෙස ගණනය කළ ඒකක විකුණුම් මිල තුළට පොදුකාර්ය පහත පරිදි අන්තර්ග්‍රහණය කර තිබේ.

| | |
|---|---|
| එකලස් යන්ත්‍ර පැය 5 ක් වෙනුවෙන් | රු. 100 |
| නිමැවුම් ශ්‍රම පැය 2 ක් වෙනුවෙන් | රු. 50 |

පහත තොරතුරුද ඉදිරිපත් කර තිබේ.

| | |
|---|---|
| අයවැයගත මුළු යන්ත්‍ර පැය | 50 000 |
| අයවැයගත මුළු ශ්‍රම පැය | 20 000 |

සේවා අංශයේ පොදුකාර්ය 3 : 1 අනුපාතයට එකලස් හා නිමැවුම් මධ්‍යස්ථාන අතර බෙදිය යුතුය.
පිරිවැය මත 20% ක ලාභයක් සහිතව විකුණුම් මිල නියම කරයි.

26. ඒකක ප්‍රාථමික පිරිවැය සහ නිෂ්පාදන හා සේවා මධ්‍යස්ථානවල මුළු පොදුකාර්ය පිරිවැය වන්නේ,

| | ඒකක ප්‍රාථමික පිරිවැය *(රු.)* | මුළු පොදුකාර්ය පිරිවැය *(රු.'000)* | |
|---|---|---|---|
| (1) | 100 | 1 900 | |
| (2) | 100 | 6 400 | |
| (3) | 150 | 1 900 | |
| (4) | 250 | 6 400 | |
| (5) | 250 | 1 500 | (.............) |

27. නිවැරදි ඒකක පිරිවැය කොපමණද?
(1) රු. 340 (2) රු. 156 (3) රු. 490 (4) රු. 290 (5) රු. 348 (.............)

28. නිෂ්පාදන ආයතනයක භාවිතයට ගන්නා **x** නම් අමුද්‍රව්‍යයට පහත තොරතුරු අදාළ වේ.

| | |
|---|---|
| දිනක උපරිම නිෂ්පාදනය ඒකක 200 | අවම ඇණවුම් කාලය සති 2 |
| දිනක අවම නිෂ්පාදනය ඒකක 100 | උපරිම ඇණවුම් කාලය සති 4 |
| ඒකකයක අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය 2kg | උපරිම තොග මට්ටම කිලෝග්‍රෑම් 16 000 |
| සතියකට නිෂ්පාදන කටයුතු සිදුකරන දින ගණන 5 | |

Accounting Chaminda Widanage

*X* අමුද්‍රව්‍යයේ යළි ඇණවුම් මට්ටම හා යළි ඇණවුම් ප්‍රමාණය වන්නේ,

| | යළි ඇණවුම් මට්ටම ඒකක | යළි ඇණවුම් ප්‍රමාණය ඒකක |
|---|---|---|
| (1) | 800 | 14 800 |
| (2) | 1 600 | 10 000 |
| (3) | 8 000 | 10 000 |
| (4) | 8 000 | 14 800 |
| (5) | 1 600 | 14 800 |

(.............)

29. තනි භාණ්ඩයක් නිපදවන සමාගමක වර්තමාන ක්‍රියාකාරී මට්ටම ඒකක 2 400 කි. එය මුළු නිෂ්පාදන ධාරිතාවයෙන් 80% කි.
සමාගමේ මුළු ස්ථාවර පිරිවැය රු. 800 000 ක් වන අතර වර්තමාන සමච්ඡේදනය ඒකක 2 000 කි.
දායක විකුණුම් අනුපාතය 40% කි.
සමාගම උපරිම ධාරිතාවයෙන් නිෂ්පාදන කටයුතු සිදු කළහොත් වර්තමාන ලාභය කොපමණකින් වැඩි කරගත හැකිද?
එවිට ආරක්ෂක ආන්තිකය කොපමණද?

| | ලාභය වැඩිවීම *(රු.'000)* | ආරක්ෂක ආන්තිකය *(රු.'000)* |
|---|---|---|
| (1) | 400 | 1 000 |
| (2) | 240 | 1 000 |
| (3) | 400 | 600 |
| (4) | 240 | 1 000 |
| (5) | 160 | 600 |

(.............)

30. නිෂ්පාදන සමාගමක් නව යන්ත්‍රයක් මිලදීගෙන නිෂ්පාදනයක් හඳුන්වාදීමට අපේක්ෂා කරයි.
නව නිෂ්පාදනය මඟින් රු. 400 000 ක වාර්ෂික ලාභයක් අපේක්ෂා කෙරේ.

| | *රු.'000* |
|---|---|
| නව යන්ත්‍රයේ ගැනුම් මිල | 700 |
| යන්ත්‍රය සවිකිරීමේ වියදම | 300 |
| සුන්බුන් අගය | 200 |
| ආරම්භක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව | 200 |

කාරක ප්‍රාග්ධනය වසර 4 ක් වන ව්‍යාපෘති කාලය අවසානයේදී උපලබ්ධි වේ.
ව්‍යාපෘතියේ පර්යන්ත මුදල් ප්‍රවාහය සහ පිළිගෙවුම් කාලය වන්නේ,

| | පර්යන්ත මුදල් ප්‍රවාහය *(රු.'000)* | පිළිගෙවුම් කාලය |
|---|---|---|
| (1) | 400 | අවුරුදු 2 |
| (2) | 200 | අවුරුදු 2 මාස 8 |
| (3) | 400 | අවුරුදු 3 |
| (4) | 200 | අවුරුදු 3 |
| (5) | 1 200 | අවුරුදු 2 මාස 8 |

(.............)

- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

31. පහත එකිනෙක ප්‍රකාශනය අදාල වන්නේ මූල්‍ය ගිණුම්කරණයටද, කළමනාකරණ ගිණුම්කරණයට ද යන්න ඉදිරියෙන් ඇති හිස්තැන තුළ සඳහන් කරන්න.
    - (i) ආයතනික අවශ්‍යතාවයන්ට හා ක්‍රමවේදයන්ට අනුකූලව තොරතුරු ඉදිරිපත් කරයි. ..............................
    - (ii) ගිණුම්කරණ ප්‍රමිත හා මූලධර්ම වලට අනුකූලව තොරතුරු ඉදිරිපත් කරයි. ..............................
    - (iii) අතීත තොරතුරු සාරාංශගතව ඉදිරිපත් කරයි. ..............................
    - (iv) ඇල්මැති පාර්ශවයන්ගේ පොදු තොරතුරු අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරයි ..............................



Accounting Chaminda Widanage

- අංක 32 සිට 34 දක්වා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

සීමිත කැළුම් සමාගමේ 2021 ජනවාරි මාසය තුළ පහත ගනුදෙනු සිදුවී තිබේ.

A. කොටසක ප්‍රතිෂ්ඨාව රු. 100 බැගින් වූ සාමාන්‍ය කොටස් 2 000 ක් නිකුත් කර සියලුම මුදල් ලබා ගැනීම.

B. ලකුණු කළ මිල රු. 500 000 ක් වූ තොග 10% ක වට්ටමක් යටතේ ණයට විකිණීම (එකතු කළ අගයමත බදු 8% කි)

C. ඉඩම් දෙවන වරට ප්‍රත්‍යාගණනය තුළින් රු. 400 000 ක ඌනතාවයක් ඇති වීම වසරකට පෙර ප්‍රථමවරට ප්‍රත්‍යාගණනයේදී රු. 250 000 ක අතිරික්තයක් ඇති වී වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස හඳුනාගෙන තිබේ.

D. රු. 100 000 ක ණයගැති අගයක් බොල් ණය ලෙස කපා හැරීම.

32. ඉහත A, B, C, D ගනුදෙනු වාර්තා කරන මූලිට සටහන් පොත සඳහන් කරන්න.

A. ........................................ C. ........................................

B. ........................................ D. ........................................

33. B හා C ගනුදෙනු ගිණුම් තැබීමේ ද්විත්ව සටහන් ඉදිරිපත් කරන්න. (සංලක්‍ෂා අවශ්‍ය නොවේ)

B. ........................................ C. ........................................

........................................ ........................................


........................................ ........................................

34. A හා D ගනුදෙනු මඟින් බලපෑමක් ඇති කරන මූල්‍ය ප්‍රකාශන මූලිකාංග දක්වන්න.

A. ................................................................................

D. ................................................................................

35. සීමිත අමිත් සමාගමේ 2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටාගෙන තිබේ.




ඉහත A, B, C, D අවස්ථාවන්ට අදාළවන ප්‍රධාන ගිනුම්කරණ සංකල්පය බැගින් නම් කරන්න.

A. ........................................ C. ........................................

B. ........................................ D. ........................................

36. සීමිත සමාගමක 2020.03.31 න් අවසන් වසරේ සහ 2021.03.31 න් අවසන් වසරේ අවසාන තොග ගණනයේ වැරදි සිදු වී ඇති බව 2021.04.02 දින හඳුනාගෙන තිබේ.

| | 2020.03.31<br>*රු.'000* | 2021.03.31<br>*රු.'000* |
|---|---|---|
| වැරදි නිවැරදි කිරීමට පෙර කාලපරිච්ඡේදයේ ලාභය | 850 | 1 200 |
| වැරදි නිවැරදි කළ පසු කාලපරිච්ඡේදයේ ලාභය | 875 | 1 400 |

එකිනෙක වසරේ තොග ගණනයේ සිදු වූ වරද වැඩියෙන් අගය කිරීමක් ද අඩුවෙන් අගය කිරීමක් ද සංචිත අගය සමඟ දක්වන්න.

2020.03.31 රු. ................................................................................

2021.03.31 රු. ................................................................................

Accounting Chaminda Widanage



මෙහෙයවීම JMC Jayasekera Management Centre (Pvt) Ltd, No. 136. Yakkala Road. Gampha. 0332229122, 0714114794

37. සීමිත චතු සමාගමේ 2021 ජනවාරි මාසයේ වැටුප් ලේඛනයෙන් පහත තොරතුරු උපුටාගෙන තිබේ.

| | රු.'000 |
|---|---|
| සේවකයින්ට ගෙවූ වැටුප | 650 |
| වැටුපෙන් අඩු කිරීම් | |
| ණය වාරික | 100 |
| වැටුප් අත්තිකාරම් | 40 |
| මූලික වැටුප මත පදනම් වූ සේවක අර්ධ සාධක අරමුදල් (EPF) සේවක දායකය | 50 |

- සේවක අර්ධ සාධක අරමුදලට සේවක දායකය 10% ක් වන අතර සේව්‍ය දායකය 15% කි.
- සේවක භාරකා අරමුදලට දායකය 3% කි.
- සියළුම දායකත්වයන් මූලික වැටුප මත පදනම්ව ගණනය කෙරේ.

(i) සමාගමේ ජනවාරි මාසයේ මුළු සේවක පිරිවැය රු. ............................................

(ii) ජනවාරි මාසයේ සේවක අර්ථසාධක අරමුදලට සේවක හා සේව්‍ය දායකයේ ගිණුම් තැබීමේ ද්විත්ව සටහන. (සංලක්ෂ්‍ය අවශ්‍ය නොවේ)

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

38. සීමිත චලිදු සමාගමේ 2020.04.01 දිනට කොටසක ප්‍රතිෂ්ඨාව රු. 100 ක් වූ සාමාන්‍ය කොටස් වල මුළු ප්‍රතිෂ්ඨාව රු. 2 000 000 කි. රු. 500 000 ක් වූ රඳවාගත් ඉපයුම් මුළු මනින්ම ප්‍රාග්ධනීකරණය කරමින් කොටසක ප්‍රතිෂ්ඨාව 100 බැගින් සංචිත ප්‍රාග්ධනීකරණයක් එදින සිදු කරන ලදී.

2020.10.01 දින එදිනට පැවති කොටස් පහකට එක බැගින් හිමිකම් නිකුතුවක් කරන ලදී. මුළු හිමිකම කොටස් හිමියන් භාවිතා කරන ලදී. කොටසක ප්‍රතිෂ්ඨාව රු. 100 කි.

2021.03.31 න් අවසන් වසරේ කාලපරිච්ඡේදයේ ලාභය රු. 3 000 000 ක් වූ අතර රු. 1 000 000 ක ලාභාංශ ගෙවා තිබේ.

2021.03.31 දිනට,

(i) සමාගමේ නිකුත් කළ මුළු කොටස් ගණන ............................................

(ii) මුළු හිමිකම රු. ............................................

39. LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු හා වැරදි) ප්‍රමිතයට අනුව,

(1) ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළහැකි අවස්ථා දෙක,

1. ..........................................................................................................

2. ..........................................................................................................

(2) ගිණුම්කරණ ඇස්තමේන්තු පසුව වෙනස්වීමට හේතු දෙක,

1. ..........................................................................................................

2. ..........................................................................................................

40. පහත එකිනෙක සම්බන්ධතාවය සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| A. | පරිවර්තන පිරිවැය | - | නිෂ්පාදන පිරිවැය | - | සෘජු පිරිවැය | (........................) |
| B. | පොදුකාර්ය පිරිවැය | - | මුළු පිරිවැය | - | නිෂ්පාදන පිරිවැය | (........................) |
| C. | නිෂ්පාදන පිරිවැය | - | මුළු පිරිවැය | - | කාල පිරිවැය | (........................) |
| D. | ප්‍රාථමික පිරිවැය | - | මුළු පිරිවැය | - | වක්‍ර පිරිවැය | (........................) |

41. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශන තොරතුරුවල තිබිය යුතු මූලික ගුණාත්මක ලක්ෂණ දෙක සහ වැඩි දියුණු කිරීමේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(1) මූලික ගුණාත්මක ලක්ෂණ දෙක ..........................................................................................

(2) වැඩි දියුණු කිරීමේ ලක්ෂණ දෙකක් ..........................................................................................



මෙහෙයවීම JMC Jayasekera Management Centre (Pvt) Ltd, No. 136. Yakkala Road. Gampha. 0332229122, 0714114794

42. නිෂ්පාදන ආයතනයක් භාවිතා කරන අමුද්‍රව්‍ය ඒකක 40 000 ක් වන වාර්ෂික අවශ්‍යතාවය රු. 4 000 ක මුළු ඇණවුම් පිරිවැයක් දරමින් ඇණවුම් 40 කින් මිලදී ගනියි. තොග ඒකකයක රඳවාගැනීමේ පිරිවැය රු. 20 ක් වන ඒකක පිරිවැයෙන් 10% කි.

(1) ආර්ථික ඇණවුම් ප්‍රමාණය ඒකක ..............................

(2) වර්තමානයේ තොගයට දරණ මුළු පිරිවැය ප්‍රශස්ථ අගයට වඩා කොපමණකින් වැඩිද?
රු. ..............................

43. නොනිමි තොග ප්‍රාථමික පිරිවැය මත අගය කරන ආයතනයක 2021.03.31 න් අවසන් වසරට පහත තොරතුරු අදාල වේ.

| | රු.'000 |
|---|---|
| නිෂ්පාදන පිරිවැය | 2 000 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | 500 |
| නිමි තොග අඩුවීම | 400 |
| නොනිමි තොග වැඩිවීම | 150 |

විකුණුම් මත දළ ලාභ අනුපාතය 20% කි.
ආයතනයේ,

(i) දළ ලාභය කොපමණද? රු. .............................. (ii) ප්‍රාථමික පිරිවැය කොපමණද? රු. ..............................

44. LKAS 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතයට අනුව පහත අයිතම කවර මුදල් ප්‍රවාහ ක්‍රියාකාරකම් යටතේ වර්ග කෙරේද යන්න දක්වන්න (අදාල තීරුවේ "✓" ලකුණු යොදා සළකුණු කරරන්න.

| අයිතමය | මෙහෙයුම් | ආයෝජන | මූල්‍ය |
|---|---|---|---|
| A. සමාගම් වල කොටස් මිලදී ගැනීමට ගෙවූ මුදල් | | | |
| B. හිමිකම් නිකුතුවෙන් ලද මුදල් | | | |
| C. සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ ලාභාංශ | | | |
| D. ගෙවූ සේවක වේතන ඇතුළු පරිපාලන වියදම් | | | |

45. 2020.04.01 දිනට ආයතනයක රු. 10 000 ක් වූ තොග ඒකක 500 ක් පැවතුනි.
මාසය තුළ දී මිලදී ගැනීම්,

| | අප්‍රේල් 10 | අප්‍රේල් 20 |
|---|---|---|
| මිලදී ගත් ඒකක | 1 500 | 1 000 |
| ඒකක මිල | 25 | 30 |

අප්‍රේල් 15 දින එකක් රු. 40 බැගින් ඒකක 1 000 ක් ද අප්‍රේල් 25 දින එකක් රු. 45 බැගින් ඒකක 1 500 ක් ද විකුණා තිබේ.
පළමු ඇතුළු පළමු පිට (FIFO) ක්‍රමය මත නිකුත් කරන ද්‍රව්‍ය මිල නියම කරයි.

(1) මාසයේ විකුණුම් පිරිවැය රු. .............................. (2) මාසයේ දළ ලාභය රු. ..............................

46. සීමිත දීප්ති සමාගම වායු සමීකරණ යන්ත්‍ර 50 ක් සිටින මලිති සමාගමට එකක් රු. 300 000 බැගින් සැපයීමට ගිවිසුමකටට 2021.01.01 දින එළඹී ඇත.
2021.01.10 දින රු. 3 000 000 ක අත්තිකාරමක් මලිති සමාගමෙන් ලැබුණි.
2021.03.20 දින වායු සමීකරණ යන්ත්‍ර 30 ක් මලිති සමාගමට සැපයූ අතර ඉතිරි මුදල් 2021.03.31 දින තෙක් ලැබී නොතිබුණි.
SLFRS 15 (ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් අයභාරය) ප්‍රමිතයට අනුව,

(A) අයභාරය හඳුනාගැනීමේ නිර්දේශය කුමක්ද?
..............................
..............................

(B) එම නිර්දේශය අනුව ඉහත ගිවිසුමේ අයභාරය හඳුනාගත යුතු දිනය කවරක්ද? ..............................

(C) ඉහත ගිවිසුමට අදාලව ගනුදෙනුවේ මිල කොපමණද? රු. ..............................



මෙහෙයවීම JMC Jayasekera Management Centre (Pvt) Ltd, No. 136. Yakkala Road. Gampha. 0332229122, 0714114794

47. සීමිත සමාගමක 2021.03.31 න් අවසන් වසරේ කොටසක ඉපයුම රු. 20 ක් වන අතර කොටසක ප්‍රතිෂ්ඨාව රු. 100 බැගින් වන රු. 2 000 000 ක සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයක් පැවතුනි. 2021.03.31 දිනට මුළු සංචිත රු. 1 000 000 කි. වර්ෂය තුළ රු. 500 000 ක ලාභාංශ ගෙවා තිබේ.

(1) කොටසක ලාභාංශය රු. ..............................................

(2) හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය ..............................................

48. ජනිත්, මලිත් සමසමව ලාභාලාභ බෙදාගනිමින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ ලාභ විසර්ජනයෙන් පසු ජංගම ගිණුම් වලින් පහත තොරතුරු උපුටා ගෙන තිබේ.

| | ජනිත් රු.'000 | මලිත් රු.'000 |
|---|---|---|
| 20.04.01 ශේෂය | 100 | 150 |
| ප්‍රාග්ධන පොලී | 200 | 100 |
| වේතන | 150 | 100 |
| ලාභ කොටස් | 100 | 100 |
| ගැනිලි | (150) | (50) |

පහත ගිණුම්කරණ දෝෂ පසුව හඳුනාගෙන තිබේ.

A. හවුල්කරුවන් අතර වේතන විසර්ජනයක් සිදු කළ ද හවුල් ගිවිසුමේ එවැනි වගන්තියක් නැත.

B. ජනිත් ප්‍රාග්ධනයට අමතව සැපයූ රු. 1 000 000 ක ණය වෙනුවෙන් 10% ක පොලී ගෙවිය යුතු වුව ද ඒ සඳහා ගැලපුම් කර නැත.

(අ) හවුල් ව්‍යාපාරයේ 21.03.31 න් අවසන් වසරේ නිවැරදි ශුද්ධ ලාභය රු. ..............................................

(ආ) ජනිත්ගේ ජංගම ගිණුමේ 21.03.31 ට නිවැරදි ශේෂය රු. ..............................................

49. මුද්‍රණාලයක නිෂ්පාදනය කරන පොතක් රු. 200 කට අලෙවි කිරීමට මිල ලකුණු කර තිබේ. කෙසේවුවද අලෙවි කිරීමේදී සෑම පොතකටම 10% ක වට්ටමක් ලබා දෙනු ලැබේ.

අනෙකුත් තොරතුරු,

| | |
|---|---|
| පොතකට කඩදාසි, තීන්ත | රු. 80 |
| මාසික කුලී | 15 000 |
| සේවකයෙකුට මාසික වේතන | 10 000 |
| මාසික විදුලි බිල | 15 000 |

සේවකයින් දෙදෙනෙකු මුද්‍රණාලයේ රැකියාව කරයි.

(1) මුළු මාසික ස්ථාවර පිරිවැය රු. ..............................................

(2) පොතක දායකය රු. ..............................................

(3) සමච්ඡේදනය වීමට අලෙවි කළ යුතු පොත් ගණන ..............................................

50. සීමිත සමාගමක් පැරණි යන්ත්‍රය විකුණා නව යන්ත්‍රයක් මිලදී ගැනීමට අපේක්ෂා කරයි.

| | රු.'000 |
|---|---|
| පැරණි යන්ත්‍රයේ විකුණුම් මිල | 200 |
| නව යන්ත්‍රයේ ගැනුම් මිල | 800 |
| නව යන්ත්‍රය ස්ථාපනය | 200 |
| නව යන්ත්‍රය මිලදී ගැනීමත් සමඟ | |
| වාර්ෂික පිරිවැය ඉතිරිවීම | 200 |
| වාර්ෂික ආදායම වැඩිවීම | 100 |
| නව යන්ත්‍රයේ සුන්බුන් අගය | 200 |

නව යන්ත්‍රය වර්ෂ 5 ක් භාවිතා කිරීමට අපේක්ෂිතය.

(1) මූලික ආයෝජනය රු. ..............................................

(2) ආයෝජනයට ප්‍රතිලාභ අනුපාතය ..............................................

(සාමාන්‍ය ආයෝජනය මත පදනම්ව)

Accounting Chaminda Widanage



මෙහෙයවීම JMC Jayasekera Management Centre (Pvt) Ltd, No. 136. Yakkala Road. Gampha. 0332229122, 0714114794